# ජීවිතය දෙස යථාර්ථවාදී බැල්මක්

විචාරය
**රසික සූරියආරච්චි**

බහුතරය නොවූවද, සංවේදී සිත් ඇත්තෝ ලොව බොහෝ ය. අනුන් ගේ දුකින් ඔවුන් සිත් සසල වේ. ඒ දුක, වේදනාව තමන්ගේ ම යැයි ඔවුනට හැගේ. හදවත් බරවේ. සුසුම් ඉපදේ. නෙත් බොඳවේ.

සැබෑ සමාජ විප්ලවවාදියෝ ද සංවේදී සිත් ඇත්තෝය. අනුන්ගේ දුක, සමාජ අසාධාරණය දැක ඔව්හූ සැලෙති. කිපෙති. ඒ නැති කරනට සපථ කරති. සමහරු අවි ද අතට ගනිති. වනසති. අවසන අවිගත්තෝ වැනසෙති.

කවියෝ ද සංවේදී සිත් ඇත්තෝ වෙති. දීන දුක, සමාජ අසාධාරණය හමුවේ ඔව්හූ ද සසල වෙති. ඒ දුක වේදනාව තමන්ගේ ම යැයි සලකති. හදවතින් හඬති. සුසුම් හෙළති. බොඳවූ දෙනෙතින් යුතුව තම අත්දැකුම් සහ එනිසා ජනිත වූ හැඟුම් සමුදය පොදු අත්දැකුමක් බවට පෙරළනු වස් කවි ගොතති. එමගින් සමාජ පෙරලියක් පතති.

මෙනයින් බලන කළ කවියා සොඳුරු විප්ලවවාදියෙක් බව පැවසිය හැකි ය. තම තුන්වන කාව්‍ය සංග්‍රහය වන -කරල් ඇහිඳින්නෝ" කෘතිය නොබෝද එළි දැක්වූ ටියුඩර් අමරසේනයෝ එවැනි සොඳුරු විප්ලවවාදීන් අතර කවි කග අතැති මහා සෙන්පතියෙකි.

අසුව දශකයේ එළිපත්තේ සිටම නව යොවුන් කවියෙකු ලෙසින් සිහල සාහිත රසික හද දිනූ අමරසේනයෝ, 1982 දී -කාලයයි මේ අවදිවන්නට" සහ 1990 දී -අළුගෝසුවාගේ සිහිනය" නමින් වූ කාව්‍ය සංහිතා තුලින් තම කවිකම ලොවට දයාද කර ඇත. දෙතුන් වසරක් තිස්සේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර සිය නිවහන කර ගනිමින්, පහන සිංහල මාසිකයේ කතුවරයෙකු ලෙස ඕස්ට්‍රේලියානු වාසී සිංහල සාහිත රසික හුදී ජන මනදෙල පිනවන අමරසෙ- "නයෝ වසර දහතකට පසුව තම තෙවන කාව්‍ය මාලාව මෙළෙස එළි දක්වන්නට සිතීම, පෙදෙහි රස හවි විඳිනා කවරෙකු ගේ වූවද අමන්දනන්දයට හේතු වනු නිසැක ය.

අමරසේන කවියාගේ කරල් ඇහිඳින්නෝ කෘතියෙහි අඩංගු කවි නිමැයුම් පොදු වශයෙන් ප්‍රධාන ප්‍රවාහයන් තුනක ලා විශ්ලේෂණය කිරීමට මම මෙහිදී අදහස් කරමි.

මින් පළමුවැන්න නම්, දුෂ්කර වූ ද, දුරස්ථ වූ ද, පසල් දනව් හි දීන ගොවි ජන දුක දැක සසල සිතැතිව ඔහු විසින් පබැඳුනු කාව්‍ය නිර්මාණයන් වේ.

කැපූ ගොයම වනසන්නට සැරසෙන අකාල මේඝය හමුවේ අසරණ වන අඳ ගොවි දුක අමරසේනයන් ගේ සුගම කවි බසින් මෙසේ පැවසෙයි.

''බැත කන්ද පරයන
ණය කන්ද දෙස බලව
පොලී මුල් ඇදි ඇදී විසල් වන
නොපෙනුනි ද වැරහැලිවු මපැල්පත
පිදුරු ලා සෙවෙණි කළ නොහැකි වූ.
තෙත බත්ව හඬන්නේ දරු කැලය.
ගිනි ගත් හිසින් තෙත බරිත
ලිප් බොක්ක අවුළුවා
සුන් සහල් කැඳ පිසින්නී බිරින්දෑ ය."

අස්වනු නෙළු කුඹුරේ ඉපනැල්ලට බැස තම සාගනි නිවනු පිණිස, ගිලිහුණු ගොයම් කරල් ඇහිඳින දරුවන් ගේ නියතිය ව්‍යංග උත්ප්‍රාසයකින් ද යුතුව කවියා මෙළෙස දකී.

''ගොවිනතින් ගිලිහී ගිය
කරල් ලෙසින්
මිහිමත ඉපදී
ගිලිහී ගිය ගොයම් කරල්
දරුවෝ '' ඇහිඳිති සතුටු සිතින්"

දීන දුක කුළු ගන්වනු වස් කවියා ජීවිතානුබද්ධ වූ අපූරු කාව්‍යමය උපමාලංකාරයන් යොද ගෙන ඇතියුරු ඉහත යෙදුමෙන් පැහැදිලි වේ. අවට ලෝකයෙන් දුරස්ථ වූ ''උඩගල් දෙබොක්ක" දුෂ්කර පෙදෙසේ ගැමියන් ගේ දුක පිළිඹිබු කරන්නට අමරසේනයෝ තම කවිලකර මෙලෙස හසුරුවති.

''දුක් හෝජනම වළඳ මිහිදනට යතී"
''දිවි ඇඳිරියට ඒ අඳුරයි එතෙන්නේ"
''නැති බැරිකම් සුලං රැලි ලෙස හමන්නේ"

බොහෝ විට කුරිරු සොබා දහමින් ද සැම විටම රුදුරු ධනිය ගෝපාල ලා ගෙන් ද බැටකන ''තිස්සපුර" ගම්මානයේ ''ඊනියා සමෘද්ධිය" හෙවත් ''ආහාර මුද්දර" ලාභීන් ගේ දුක අමරසේනයෝ මෙලෙස කවි කරති.

''නාගදීප වැව් දියවර නැති හින්ද
මේ කන්නයේ අපි වැපිරුවෙ නැති හින්ද
පුතුගෙ අහර මුද්දර අත ඇති සන්ද
හාල් කිලෝවක් දෙනු මැන මැති සන්ද"

ගමේ දුක පිළිබඳ විෂම චක්‍රය සදතනිකව කැරකෙන්නේ අධ්‍යාපන ක්‍ෂේත්‍රය වසාගත් ''කොළඹට කිරි ගමට කැකිරි" ප්‍රතිපාදන ප්‍රතිපත්තිය නිසාය. මා මෙහි ලා විමසන්නට අදහස් කරන අමරසේන කාව්‍යකරණයේ දෙවන ප්‍රවාහය නම් ඒ දුෂ්කර පලාත් පිළිබඳව වූ සදකාලික දුක්බර අවනඩුවයි. කවියා එය මෙලෙස සරදම් බසින් අපට පවසයි.

''සම අවස්ථා බූමරැංගය
ගසති නිල දරුවෝ විටින් විට
එහෙත් .... ප්‍රඥාවේ ප්‍රදීපය
ඉබි ගමනකින් ඇදේ හෙමිහිට
දහ අට වංගුවෙන් පහලට"
දුෂ්කර පලාත් වල සිසුවෝ ද, ඔවුනත සිප් සත ලබා දීමට දඩුවම් ලබන ගුරුවරු ද එක සේ දුක් ජාලාවක ගිළෙති. මේ දුක් කඳ මැද, කෙලෙස නම් දුෂ්කර පලාතක උපදින මල් කැකුලක් ගුරු මලක් සේ පිපෙන්න ද? මෙම කරුණ උක්තව ලියවුනු ''සිගිති මලෙක නැගි කඳුලක්" කාව්‍යය අප නෙතට ද කඳුලක් නංවයි. එලෙසම දුක්බරිත දිවියක් ගත කරන දුෂ්කර පලාත් ගුරු දුක ''සත්තමයි දුෂ්කරයි" නිර්මාණයේ දී අමරසේනයෝ මෙසේ දක්වති.

''ලද ශිල්ප සාපයක්
වී නිබඳ හඹා විත්
කැදැල්ලට යන්න ඉඩ නොදෙන්නේ
සත්තමයි දුෂ්කරයි



මේ බිමේ දිවි ගෙවුම
මහා කඳු නොමැත ඇස හරින්නේ"

''ගුරුවරු සහ ගෝලයෝ" කවෙහි මේ දුෂ්කර පලාතේ ගුරු දිවිය මෙලෙස විස්තර කෙරේ.

''කුස කුස සාගිනි ය
ගත ගත වැරහැලි ය
නෙත නෙත කඳුළැලිය
සිත නැත උගත් සිප් සත"


කාලයාගේ ඇවෑමෙන් මේ දුකට හුරු වී, සිප් සත ලබන මල් වැනි දරු කැලට පෙම් බඳින ගුරු සිත මෙසේ සැනසෙයි.

''දුක් පඳුරු දළු ලන මෙඅඩවියේ
නුඹලා ට එකම එක අකුරක්
පුදන්නට ලද වරම
දඬුවමක ලෙසින් සපැමිණි
භාග්‍යයකි ! මහත් ආශිර්වාදයකි !!

සබඳ, බිම්තැන්න,
සිත් කළුය"

අවසානයේ ගුරුවරයා දුෂ්කර සේවය හමාරකොට ඒ පෙදෙසින් පිටවී යන්නට සිත හදගන්නේ ද දුකකිනි.

''සිව් වසක් සිප් සැදූ




දුෂ්කර ඉසව්වෙන් සමුගන්න යාමයයි
නිති පැතූ මව් සෙවන
වෙත කෙලෙස පිය නගමි
මෙසුහුඹුල් මල් කැකුළු හැරපියා
දෙස් නගයි සිත''සෝ බරය හද"

''කරල් ඇහිඳින්නෝ" සංහිතාවේ මා දකින වැදගත්ම කාව්‍ය ධාරාව නම් මීට දශක දෙකකට පෙර කලෙක ඇරඹී, දෙතුන් වසරක් තිස්සේ ශ්‍රී ලංකාව කළඹවා ලූ, රටේ සම්පත්, තරුණ ජීවිත දස දහස් ගණනින් විනාශ කළා වූ අධම, තිරශ්චීන ඝාතන සංස්කෘතිය අත්විඳ, එසොවින් කම්පිත වූ කවියා විසින් නිර්මාණිත කාව්‍යයන් ය. අද කාලයත් සමගම වියැකී යන හුදු මතකයක් බවට පත්වී ඇති, ඒ සමගම විවිධ අවස්ථාවාදී දේශපාලනික හේතු මත මතකයෙන් මුලිනුපුටා දැමීමට අධම තැත්නද දැරෙන ඒ භීෂණ සමය පිළිබඳ මතකය, අමරසේනයෝ විටෙක හද සනසන සුගම බසින් ද, විටෙක සිත කළඹන අයුරින් ද අප නෙත ඉදිරියේ මවති.

බලු පොරයකට මැදි වුනු බලු පැටියෙකු ගේ අකාල මරණය කවියා මෙලෙස දකියි.

''බල ලොබ රකිනු වස් මරණය දිනු බිමක
කුස ගිනි ලොබින් බලු පොරයක් යනු කිමෙක
දෙදහස් වසක් ඉපැරණි උත්තම දැයක
නටඹුන් තිබිණ මහ මග දැවු ටයරයක"

දෙවිඳතුන් බුදු වෙන්නට තැත දැරූ මේ විපරීත කාලය දෙස අමරසේනයන් ගේ සෝපාහාසය මෙලෙස යොමුවෙයි.

''අහා විස්මයකි
පූජාසනයෙන් ගලා යයි රුධිරය ගංගාවක් සේ,
පිපී සැලෙති නෙක පුෂ්පයෝ කෙටල දිය හබරල ඈ
රුධිර කෙළිති කබරයෝ තුටු පහටුව"

''ක්‍ෂුධාවෙන් පෙළෙන
වියාලයෝ ද කීන බල්ලෝ ද
බලා හිඳිති
දෙවිඳතුන් හිස සිසාරා
ෂඩ් වර්ණ රශ්මීන් නැගෙන තුරු"

හුන්නස්ගිරි කඳු පාමුල අසබඩ සිදු වූ මහා මිනිස් විනාශය කවියා තම ''වැලපෙන සොල්දදුවා ගේ කන්ද" නමැති කාව්‍යයෙන් අප සන්තානයට නංවයි.

''සිහිවිනිද....නුඹ අතින් පෙති සිඳුණු
පොපියමින් පිපී ආ
තුරුණු මල් කැකුළු රොද
නො එසේව....අසරණ වු මව්වරුන්
දෙනාසා පුට තුළින්....හෙළන සුසුමක් වැකී
විකල් වුයේ ද සිත....?"

මෙකල සිදුවූ ඒ ම්ලේච්ඡ ඝාතනයන් ගෙන් වඩාත් දුක් වින්දෝ තම පුතුන් සදදරයෙන් සැදූ මෑණිවරුය. මේ මව් දුක පිළිබඳව කවි හද සැලෙන්නේ මෙලෙසය.
''දෙව් සිත් පොබයමින්
බබුළුවා අග හිඟ ගහණ පැල්පත
පහනින්''පහන දල්වමින්
දිලි''යොවුන් පහන් පෙළ
රාක්‍ෂස මහෝගය හමා විත් නිවූයෙන්
ළ සෝ අඳුරත
දැවෙන.. තැවෙන.. ඉකිලන.. සුසුම්ලන
අම්මාවරුන් ගේ හඬ
දෙදරවයි සවන් තල"

''මවකගේ විලාපය" කවෙහි මේ ව්‍යවසනය වඩාත් තීව්‍රව මෙලෙස දැක්වේ.

''උමතුව වැන්නී
වරලස අවුල් කරන්නී
කඳුළු සලන්නී
ලෙහි අත් ගසා තැවෙන්නී
පුතුන් සොයන්නී
බලවතුනට අයැදින්නී
සුසුම් හෙලන්නී
මිහි කත කළඹා ලන්නී"

මේ කාව්‍ය සංහිතාවේ ප්‍රහලතම කාව්‍යය වන්නේ ''රුධිර මංගල්‍යය" නම් වූ නිර්මාණයයි. කවියා, කොට මුගුරු ගිණි අවි දෑරූ මස් බුදින වෘකයින් මෙසේ අමතයි.

''විසාලා මහනුවර දුබික් බිය පරයවා
දනන් සිත් පෙදෙන් පෙද
වෙළෙවි කොට භීතියෙන්
රුව ගුනෙන් සුවඳින් සපිරි මල් කැකුළු
පිර පීරා සොයව්!
තලා හප කොට මග දෙපස ලව් !!
ඔවුන් කුළුඳුල් ලෙයින් දංගෙඩිය තෙත් කරව් !!!
මේ රුධිර මංගල්‍ය යාමයයි
ආයු පිරිහුණු දෙව්වරුන්ගේ කාලයයි"

මේ කවෙහි එන සිත සසල කරවන අනුභූතිය, හද බර කරවන ආකෘතිය සහ රුහිරු පෙලන අන්තර්ගතය ගැන සලකන විට, මෙම කාව්‍ය සංග්‍රහය නම් කළ යුතුව තිබුනේ ''රුධිර මංගල්‍යය" නමින් යැයි මම සිතමි.

මීට අමතරව ''වික්ටර් හාරා", ''චේ" සහ ලංකාව අරඹයා ලියවුනු කවි කිහිපයකින් ද, ඉංගිරිසි කවි පන්ති කිහිපයක සිංහලානුවාදයන් ගෙන් ද, රුධිර මංගල්‍යය කාව්‍යයේ ඉංගිරිසි අනුවර්තනයකින් ද ''කරල් ඇහිඳින්නෝ" කාව්‍ය මාලාව සමන්විත වේ.

අවසාන වශයෙන් කිවයුත්තේ, ඕස්ට්‍රේලියාව සිය නිවහන කරගෙන සිටින විප්‍රවාසී කලාකරුවෙකු ලෙස අප අමරසේනයන් ගෙන් මීලගට බලාපොරොත්තු වන්නේ තත්කාලීන විගාමික අත්දැකුම් කුළු ගන්වන කාව්‍ය සංග්‍රහයක් බවයි.

අමරසේනයනි, මේ එයට කාලයයි! දීපයයි!

2007 සන්නස සාහිත්‍ය තරගාවලියේ මුල් තැන ගත් කෙටිකතා දහය




පළමුවැනි තෑග්ග
කෙටිකතා සංග්‍රහය
දැන් තැපෑලෙන් ලබා ගන්න
තැපැල් ගාස්තු සමග මිල
ඩොලර් 5

Sannasa News Group
22 Lorne Street Lalor Vic 3075
03 9402 5380